**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු **11** දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර**,** එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි **31** දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 10 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**
--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 අනුකූල නොවීම්**
------------------

**නීති , රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**
--------------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | **(i)** අංක 5(3) රීතිය | ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර පරීක්ෂාවක් පවත්වා නොතිබුණි. | ආදායම් රැස්කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂාවක් ඇති කළ යුතු වේ. | ආදායම එක් රැස් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආකාරයක අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර නොතිබු බව පිළිගන්නා අතර එය සිදු කිරීම සඳහා ලිඛිතව උපදෙස් දී ඇත. |
| | **(ii)**අංක 205 රීතිය | 2018 වර්ෂයට අදාලව පත්කර තිබූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වේ. | ඉදිරියේදි මහ සභා තීරණයට අනුව සමීක්ෂණ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| **(iii)**අංක 218 රීතිය | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා හා සභාව විසින් පදිංචියට ගන්නා ලද සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සියලු දේපළ වාර්ෂිකව සමීක්ෂණය කළ යුතු වේ. | ඉදිරියේදි වර්ෂයකට වරක් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර පරීක්ෂා කරවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 1645 | සභාව විසින් භාවිතා කරනු ලබන සියළුම වාහනවල දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | ධාවන සටහන් නියමිත දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | සභාව සතු සියළුම වාහනවල දෛනික ධාවන සටහන් රියදුරන් ලවා යාවත්කාලීන කිරීමටත්, ඊළඟ මාසයේ 15 දිනට පෙර එම ධාවන සටහන් විෂයභාර නිලධාරියා මගින් විගණනයට යොමු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන චක්‍රලේඛය | සභාව සතු පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතු වේ. | සභාව සතු පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් ඉදිරියේදි වෙනමම පවත්වා යන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2 .1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,622,281ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම රු.374,808 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම රු. '000 | 2018 බිල් කළ ආදායම රු. '000 | 2018 රැස් කළ ආදායම රු. '000 | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. '000 | 2017 ඇස්තමේන්තුගත ආදායම රු. '000 | 2017 බිල් කළ ආදායම රු. '000 | 2017 රැස් කළ ආදායම රු. '000 | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් බදු | 895 | 990 | 892 | 1,040 | 805 | 814 | 872 | 942 |
| කුලී | 35,108 | 2,083 | 2,083 | 1,484 | 32,927 | 2,153 | 2,026 | 1,484 |
| බලපත්‍ර ගාස්තු | 571 | 354 | 354 | - | 325 | 199 | 199 | - |
| වෙනත් ආදායම් | 3,170 | 60,239 | 64,865 | 17,708 | 7,280 | 52,386 | 52,824 | 14,890 |
| එකතුව | 39,744 | 63,666 | 68,194 | 20,232 | 41,337 | 55,552 | 55,921 | 17,316 |

❖ රැස් කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

## 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුලී ආදායම් හා බලපත්‍ර ගාස්තු ආදායම් රැස් කිරීම් බිල්කිරීම් ලෙස දැක්වීම නිසා හිඟ ආදායම් නොතිබුණි. සමාලෝචිත වර්ෂයට රැස් කළ යුතු රු.1,932,000 ක් වූ මුළු වරිපනම් බදු වලින් රු.892,000ක් රැස්කර තිබුණි. | අයවිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | බදු දේපළ 02 ක් සඳහා නඩු කටයුතු ආරම්භ කර ඇති අතර හිඟ ආදායම් අය කිරීමට කටයුතු කර ඇත. |

### 2.2.3 වරිපනම් හා බදු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 19 කට පෙර ලබාගෙන තිබූ තක්සේරු වටිනාකම් මත දිගින් දිගටම වරිපනම් බදු අයකිරීම් සිදුකර තිබුණි. | වරිපනම් තක්සේරුව ලබාගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

### 2.2.4 අක්කර බදු

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.616,784 ක හිඟ ශේෂයක් පැවති අතර වර්ෂය සඳහා බිල් කරන ලද මුදල රු.74,000 ක් පමණ විය. | නිවැරදි හිඟ ශේෂයන් පරීක්ෂා කර අයවිය යුතු මුදල් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | අක්කර බදු අය කිරීම් සම්බන්ධ මේ වන විට අයිතිය හඳුනාගත නොහැකි බැවින් පරීක්ෂා කර හිඟ මුදල අය කිරීමට කටයුතු කරමි. |

-------

### 2.2.5 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් කුලී පදනම මත ලබාදෙන ලද කඩ කාමර වලින් අයකළ යුතු කුලී රු.952,511 ක් අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ කඩ කාමර හිමියන්ගේ බදු අයිතිය ආපසු පවරා ගැනිමටත් මැයි මස සිට අදාළ කඩ කාමරවල බිල් කිරිම නවත්වා හිඟ අය කිරීමට මහා සභාවෙන් යෝජනා විය. ඒ අනුව ඉදිරි කටයුතු කරමින් සිටින බව කාරුණිකව දන්වා සිටිමි. |

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු උසාවි දඩ රු.1,949,518 ක්ද ලැබිය යුතු මුද්දර ගාස්තු රු.7,816,388 ක්ද ලබාගැනීමට ක්‍රියාකර නොතිබුණි. | ලැබිය යුතු උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ මුදලින් 2019.06.10 දින වන විට රු.1,230,523ක් හා මුද්දර ගාස්තු වලින් රු.4,784,186ක් ලැබී ඇත. ඉතිරි මුදල් අය කරගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ 1988 වර්ෂයේදී කරුණු 42 කට අදාලව අතුරු ව්‍යවස්ථා ගැසට් කර තිබූ අතර අතුරු ව්‍යවස්ථා 05 ක් වැළඳගෙන තිබුණි. ඒ තුලින් සභා ආදායම් රැස්කළ හැකි අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කර නොතිබුණි. | සභාවට අදාල අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ අතුරු ව්‍යවස්ථාවන්ට අනුකූලව සභා බල ප්‍රදේශය තුළ අය කර ගැනීමට හැකි සියළුම ආදායම් අය කර ගැනිමට කටයුතු කර ඇත. |

#### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ඇති බව දන්වමි. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් රු.3,807,268 ක වටිනාකමකට ඉදිකර තිබූ කොම්පෝස්ට් අංගනය සමාලෝචිත වර්ෂය තුල ඵලදායි ලෙස යොදාගෙන නොතිබුණි. | උසස් තත්ත්වයේ කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. | අංගනයේ අට්ටි සකස් කරන මතුපිට පොළොව කැඩී ඇති අතර එම ස්ථානවලින් වැලි මතුවීම සිදුවේ. අධික වැලි සහිත එම පෙහොර විකිණීමට පවා නුසුදුසු මට්ටමක පවතී. ඉදිරියේදී කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන දෛනික වැටුප් පදනම මත සේවකයින් බඳවා ගැනීමට අපේක්ෂා කරයි. |

**(ඈ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේදී එය ඉටුකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | අදාල අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳ වඩාත් අවධානය යොමු වූයේ 2019 වර්ෂයේ බැවින් 2019 වර්ෂයේ සිට එම අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමු. |
| (ii) | ප්‍රාදේශීය බල ප්‍රදේශය රමණීය කලපු තීරයකින් හා ඔයවල් 02 කින් යුක්ත බැවින් ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම සිය මෙහෙවරෙහි කොටසක් වුවද කලපු තීරය ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම හා එහි මත්ස්‍ය සම්පත වර්ධනය තුලින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා සභාව විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | සභාවේ මෙහෙවර කෙරෙහි වැඩි අවධානය යොමු කර කටයුතු කළ යුතු වේ. | 2020 අයවැය මගින් කලපු තීරය ඇතුළු ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා -

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.3,728,438 ක් වටිනා ගොඩනැගිලි 03 ක් හා උපකරණ ක්‍රියාකාරී තත්ත්වයක නොපැවතීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි. | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය කළ යුතු වේ. | ජනතාවගේ නොපැමිණීම හේතුවෙන් මේ වන විට මෙම සතිපොළවල් 02 ක්‍රියාත්මක නොවන අතර ඉදිරියේදි සතිපොළවල් ආරම්භ කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | හිඟ ආදායම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. | හිඟ ආදායම් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදි හිඟ ආදායම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | එළුවන්කුලම ජල පොම්පාගාරයට විදුලිය ලබාගැනීම සඳහා ප්‍රතිපූරණ පදනම මත සභාව විසින් වැය කරන ලද රු.58,775 ක මුදල වසරක අධික කාලයක් ගතවී ඇතත් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාව විසින් වැය කරන ලද රු.58,775ක මුදල පුරනැගුම ව්‍යාපෘතිය හරහා සභාවට නැවත ලබා ගැනීම සඳහා අදාළ ආයතන ලිඛිතව දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී වාහන කුලියට දීමෙන් ලද ආදායම් රු.168,400 ක තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඉ) | සභාව විසින් ඉදිකරන ලද කඩ කාමර 57 ක භූමියෙහි අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙතින් නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මිනුම් කටයුතු සිදු කිරීමේ ප්‍රමාදයන් මත පවරා ගැනීම් කටයුතු ඇන හිට ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය ------

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත තනතුරු සංඛ්‍යාව 13 ක් වූ අතර 03 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අනුමත නොවන තනතුරක් වන ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුරක කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු සේවයේ යොදවා තිබුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම හා අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට පියවර ගත යුතු වේ. | මෙහිදී එම අනුමත තනතුරු 02 සංවර්ධන නිලධාරි තනතුර වන අතර 2015 වර්ෂයේ බඳවා ගත් සංවර්ධන නිලධාරි 08 දෙනෙකු වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අප ආයතනය වෙත යොමු කර ඇත. එසේම අප ආයතනයට වෙනම |

| | | |
|---|---|---|
| | | තනතුරු නාමයක් යටතේ සංවර්ධන නිලධාරින් 07 දෙනෙකු අනුමත කර ඇති අතර එයින් 04 දෙනෙකු මේ වන විට පුරප්පාඩුව පවති. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් කුලී පදනම මත සේවා සපයනු ලබන වාහන හා උපකරණ ආදායම් රැස්කර ගැනීම සඳහා ප්‍රමාණවත් හා කාලීනව පරික්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබූ අතර සපයනු ලබන සේවාවට අදාල ආදායම සභාවට ලැබෙන බවට තහවුරු කර නොතිබුණි. | අදාළ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | කුලී පදනම මත වාහන ලබා දීමේදි අනුගමනය කළ යුතු ක්‍රමවේදය විධිමත්ව සකස් කර තිබෙන අතර වෙනත් ආදායම් ලේඛනයක්ද නඩත්තු කරන හෙයින් අදාළ රියදුරන්ද දැනුවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**3.5 හඳුනාගත් අලාභ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාවිතයට නොගන්නා දුරකථනයක් වෙනුවෙන් වසර 03 ක කාලයක් ස්ථාවර ගාස්තු ලෙස රු.54,092 ක් ගෙවා තිබුණි. | භාවිතයට නොගන්නා දුරකථන වෙනුවෙන් ගෙවීම් නොකළ යුතු වේ. | මේ වන විට විසන්ධි කර ඇත. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙල කර තිබූ අයවැය අනුව වැය විෂයයන් 28 ක රු.4,578,363 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර වැය විෂයයන් 55ක සියයට 20 ට වැඩි ප්‍රතිපාදන ඉතිරි වීම් රු.13,915,269 ක් විය. | තාත්වික අයවැය පිළියෙල කළ යුතු වේ. | 2018 වර්ෂයේ දී අපේක්ෂිත පුනරාවර්තන සහ ප්‍රාග්ධන ආදායම් රැස් කිරීමට අපොහොසත්වීම මත ඇතැම් වැය විෂයයන් යටතේ වියදම් දැරීමට නොහැකි විය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂය තුල සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතු වේ. | සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සෑම මසකම අභ්‍යන්තර විගණනයක් සිදු කර ඇත. |